# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2471/58 – 2026 ජනවාරි මස 16 වැනි සිකුරාදා – 2026.01.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හලංගොඩ (ඊ347ඒ) සහ බලකඩුව (ඊ357ඩී) ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, හලංගොඩ සහ බලකඩුව ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/UKW/2021/420 හා 2022.04.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – බටකොටුවේ හේන – ප්‍රමාණය: හෙක්. 0.0037**

උතුරට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ එච්.ඒ.ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන; නැගෙනහිරට: එච්.ඒ.ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන සහ බලකඩුව ඔය; දකුණට: බලකඩුව ඔය සහ එච්.ඒ.ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන; බටහිරට: එච්.ඒ.ජයවර්ධන හිමිකම් කියන බටකොටුවේ හේන සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය.

**02. කැබලි අක්ෂර 'B' – ඇටඹගහමුල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0026**

උතුරට: බලකඩුව ඔය සහ රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුල වත්ත; නැගෙනහිරට: රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුල වත්ත සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුල වත්ත; බටහිරට: රුවිර තරංග අල්විස් ජයවීර හිමිකම් කියන ඇටඹගහමුල වත්ත සහ බලකඩුව ඔය.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/65.
2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0158


1A – G 046110 – 11 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*